ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය

**කොළඹ**

පුවත්පත් නිව**ේදනය**

<u>**ලෝක** භාවනා දිනය **2024** දෙසැම්බර් **21** වන දින **කොළඹදී** සැමරේ</u>

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය හා එක්ව 2024 දෙසැම්බර් 21 වන දිනට යෙදුණ ලෝක භාවනා දිනය නිමිත්තෙන් විශේෂ භාවනා සැසි දෙකක් සංවිධානය කර තිබිණ. කොළඹ සහ රත්නපුර පැවති මෙම සැසි, භාවනා පුහුණුව හරහා සහභාගීවූවන්ගේ මානසික සහ කායික යහපැවැත්ම ඉහළ නංවා ගැනීම සඳහා මාහැඟි අවස්ථාවක් විය.

2. එක් සැසියක් කොළඹ මයුරපති භාවනා ශාලාවේ පැවති අතර අනෙක් සැසිය රත්නපුර, කලාටුවැව ජේතවනාරාම බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්විණ. මෙම සැසි දෙක සඳහාම විශාල පිරිසක් සහභාගී වූ අතර ඔවුහු භාවනා සැසි වලින් ලද සන්සුන්භාවය සහ ප්‍රතිලාභ අගය කළහ.

3. 2024 දෙසැම්බර් 6 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් A/79/L.27 යෝජනාව ඒකමතිකව සම්මත කරමින් දෙසැම්බර් 21 වන දින ලෝක භාවනා දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. යෝජනාවේ මූලික කණ්ඩායමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඇතුළත් වූ අතර ඒ හරහා මානසික සහ කායික සෞඛ්‍යය සඳහා භාවනාවේ ධනාත්මක බලපෑම ලොවට ගෙනයාම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් දරන ලදි. මෙම දිනය ප්‍රකාශයට පත් කිරීම සාකල්‍ය සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන යෝගා ව්‍යායාම සහ භාවනාවේ සමීප සබඳාවය අවධාරණය කරයි. දෙසැම්බර් 21 වන දිනය ලොව උතුරු අර්ධ ගෝලයේ කෙටිම දිවා කාලය සහ දිගුම රාත්‍රී කාලය ඇති දිනය ද වන අතර මෙම සංසිද්ධිය ප්‍රත්‍යාවලෝකනය සහ නව ඇරඹුමක් සඳහා සුදුසු කාලයක් ලෙසින් ද සැලකෙන බැවින් භාවනාව මෙන්ම තම යහපැවැත්ම පිළිබඳ අවධානය යොමු කිරීමට මනා අවස්ථාවක් වේ.

***

**කොළඹ**

***2024** දෙසැම්බර් **21***